ගිකෝර

අර්මේනියානු ලේඛක
හොවානෙස් තුමාන්‍යාන්

පරිවර්තනය
මුතුමුදලිගේ
නිශ්ශංක

ගිණුකාර්

හයවන මුද්‍රණය : ජනවාරී 2025

ISBN 978-624-5552-22-1

මුද්‍රණය

එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්

නො 27/18 ජයන්ත වීරසේකර මාවත

කොළඹ 10

කෝදුපත් පරීක්ෂාව

අශෝක කුලතුංග

කවර නිර්මාණය

ප්‍රදීප් ප්‍රේමලාල්

පරිඝනක පිටු සැකසුම

කාවින්ද්‍යා රත්නායක

මෙම පොතෙහි සියලුම හිමිකම් ඇවිරිණි. කර්තෘගේ අවසරය නිසි පරිදි ලිපියකින් නොලබා මෙහි එන කිසිවක්ම, මොනම ආකාරයකින්වත් නැවත පළ කිරීම තහනම් වේ. එම තහනමට අතින්, යාන්ත්‍රිකව හෝ විද්‍යුත් ක්‍රමයකින් පිටපත් කිරීම, වීඩියෝ හෝ ඕඩියෝ ලෙස නිර්මාණය කිරීම, ඊ -බුක්, පිඩීඑෆ් ලෙස හෝ වෙබ් අඩවිවල පළ කිරීමද ඇතුළත් බව සලකන්න.

ප්‍රකාශනය : පොත්මී ප්‍රකාශන

I will dedicate this amazing book to
My professors of Yerevan State University,
With love and respect
To

Simon Petrosyan

Marina BabakAnyan

Nune Aviazyan

Narine Torosyan

Gayane Balyan

1

මේ දේ කරනවට කවුරුවත් ම කැමති වුණේ නැහැ, ඒත් ගෙදර ගෘහ මූලිකයා වුණු හම්බෝ ඒ දේ කරන්න ම හිතා ගත්තා. එයාගේ අදහස වෙනස් කරන්න කාටවත් ම පුළුවන් වුණේ නැහැ.

හම්බෝ තීරණය කළා එයාගේ අවුරුදු දොළහක පුංචි පුතා

"ගිකෝර්"ව නගරයට අරගෙන ගිහින් රස්සාවකට දාන්න.

"මේකා එතකොට ලෝකය ගැන දැන ගනීවි" ඔහු කිවුවා.

එහෙත් ඔහුගේ බිරිඳ නම් ඒ තීරණය ගැන ගොඩක් දුක් වුණා.

"මගේ අහිංසක දරුවව කිසිම අනුකම්පාවක් නැති මේ ලෝකයට යවන්න එපා" ඇය ඇඬුවා, වැලපුණා, ඒත් හම්බෝ ඇයව සතේකටවත් ගණන් ගත්තේ නැහැ.

එක්තරා සාමකාමී, එහෙත් ගොඩක් දුක්බර උදෑසනක පුංචි ගිකෝර්ට එයා ජීවත් වුණු ගමෙන් සමුගන්නට සිද්ද වුණා.

ගිකෝර්ගේ පවුලේ අය, අසල්වැසියන් එක්ක ගමේ මායිමට වෙනකන් ම ගිකෝර්ගේ පස්සෙන් ආවා.

ගමේ මායිමේ දී ඔවුන් ගිකෝර්ව වැලඳ ගත්තා; ඔහුට හාදු දුන්නා. ගිකෝර් තාත්තත් එක්ක එයා ඈතට යන හැටි බලාගෙන හිටියා. ගිකෝර්ගේ නංගී "ෂැනී" හොඳට ම ඇඬුවා. ගිකෝර්ගේ මල්ලි පුංචි "ගැලෝ" ගිකෝර් ඈත් වෙලා යන දිහා බලාගෙන කෑ ගැහැවුවා.

"ගිකෝ... ගිකෝ.. කොහේද ඔයා යන්නේ ගිකෝ?"

ටික දුරක් ගිහින් ගිකෝර් ආයෙමත් පිටුපස හැරිලා බැලුවා. එයා දැක්කා ගමේ හැමෝම තවමත් ගම් මායිමේ හිටගෙන ඉන්නවා. එයාගේ අම්මා ලේන්සුවකින් ඇස් දෙකෙන් වැටෙන කඳුළු පිහදනවා. ගිකෝර්ට හිතුණා තාත්තගේ අත අත්හැරලා අම්මා ළඟට දුවගෙන යන්න. ඒත් තාත්තා ගොඩක් තදින් ගිකෝර්ගේ

අත අල්ලගෙන හිටපු නිසා එයාට එහෙම කරන්න පුළුවන් කමක් තිබුණේ නැහැ.

***

ටික දුරක් ගියා ම තාත්තා එයාගේ අත බුරුල් කළා. ගිකෝර් පිටිපස්ස හැරිලා බැලුවා. එහෙත් ඒ වෙනකොටත් ගම්මානය කන්දට වැහිලා ගිහින්. එයාට කාවවත් පෙනුණේ නැහැ. එයා තාත්තගේ අනිත් පැත්තටත් මාරු වෙලා බැලුවා. ඒත් කිසිම දෙයක් පෙනුණේ නැහැ.

ගිකෝර් සැරින් සැරේ පිටිපස්ස හැරි හැරි යනවා දැකපු එයාගේ තාත්තා හම්බෝ කෑ ගැහැවුවා.

"අඩිය ඉක්මන් කරලා වරෙන් ගිකෝර්... අපි දැන් නගරයට ළඟ යි"

නගරයට යන්න තිබුණු පාර තිබුණේ කඳු පන්තියක් හරහා. ගිකෝර් තාත්තත් එක්ක කඳු එකින් එක නගින්න පටන් ගත්තා.

ටික වෙලාවකින් ඔවුන් කඳු මුදුනකට ආවා.

එතකොට ගිකෝර් දැක්කා කන්ද පහතින් ගොඩක් පුංචියට එයාගේ ගම පේනවා. ගිකෝර්ට ගොඩක් සතුටු හිතුණා. එයා සතුටින් කෑගහන්න පටන් ගත්තා.

"තාත්තේ මට අපේ ගේ පේනවා.. මට අපේ ගේ පේනවා"

ගිකෝර් ඇතින් යාන්තමට පේන ගම්මානය දිහාවට ඇඟිල්ල දික් කරගෙන තාත්තට කිවුවා.

හම්බෝත් ඒ පැත්ත හැරිලා බැලුවා. ඈතින් ගම්මානයත් පෙනුණේ යාන්තමට නිසා ගෙයක් නම් කොහෙත් ම පෙනුණේ නැහැ. හම්බෝ මුකුත් ම නොකියා අහක බලා ගත්තා.

"අඩිය ඉක්මන් කරලා වරෙන් ගිකෝර්... අපි දැන් නගරයට ළඟ යි"

2

ගමෙන් පිටවෙලා ආපු මුල් ම රාත්‍රිය හම්බෝ ගත කළේ එයාගේ පරණ යහළුවෙක්ගේ නිවසක.

ඒ යහළුවත් බොහෝ ම සාදරයෙන් හම්බොව පිළිගත්තා.

ටික වෙලාවකින් ගෙදර හිටපු පුංචි ගැහැනු ළමයෙක් අමුත්තන්ට තේ හදන්න පටන් ගත්තා.

ඇය තේ හදද්දී වීදුරු එකිනෙකට ගැටීමෙන් ආපු "සිලින්... සිලින්" සද්දේ ගේ පුරා ම පැතිරිලා ගියා. ගිකෝර් ඇය දිහා බැලුවා. ඒ පුංචි ගැහැනු ළමයා ඇඳගෙන හිටියේ ලස්සන රතු පාට ගවුමක්.

'මේ ගවුම නම් ෂැනීටත් ගොඩක් ලස්සනට තියෙයි' ගිකෝර් හිතුවා.

එදා ගිකෝර් ස්ථිරව ම එක දෙයක් අධිෂ්ඨාන කරගත්තා. ඒ තමයි කවදා හරි නගරයේ රස්සාවෙන් මුදල් හම්බ කළා ම එයාගේ නංගි ෂැනීටත් මේ වගේ ලස්සන රතු ගවුමක් අරන් දෙන්න.

රාත්‍රී ආහාරයෙන් පස්සේ හම්බෝ එයාගේ යහළුවත් එක්ක ගොඩක් වෙලා කතා කළා. ගිකෝර්ව නගරයට අරගෙන යන එක ගැන ඔහුගේ යහළුවත් බොහෝ ම සතුටු වුණා. ඒ ගැන ඔහු හම්බෝට ප්‍රශංසා කළා.

"පොඩි එකා මේ ලෝකය ගැන දැනගන්න ඕනේ" ඔහු කිවුවා.

ඒ කතාවෙන් පස්සේ ඒ දෙන්නා යුද්ධය ගැන කතා කරන්න පටන් ගත්තා. ඊට පස්සේ කාලා, බීලා ඉන්න බැරි වෙන තරමට ම කෑම බීමවල මිල වැඩි වුණ හැටි කතා කළා. ඊටත් පස්සේ තවත් ගොඩක් දේවල් ගැන කතා කළා. ඒත් ගොඩක් දුර ඇවිදපු මහන්සිය නිසා ම ගිකෝර්ට ඒ වෙනකොටත් හොඳට ම නින්ද ගිහින් තිබුණා.

ඊට පහුවෙනිදා ඔවුන් නගරයට ළඟා වුණා. නගරයේ ගත කරපු මුල් ම දවසේ ඔවුන් ගත කළේ අශ්වයන් බලා ගන්නකුගේ මඩුවක. එදා රාත්‍රිය මඩුවේ ගත කරපු හම්බෝ පහුවෙනිදා උදෙන් ම ගිකෝර්වත් අරගෙන නගරයේ වෙළඳපොළට ගියා.

"පොඩි එකා මේ ලෝකය ගැන දැනගන්න ඕනේ"

3

හම්බෝ ගිකෝර්ට රස්සාවක් හොයමින් වෙළඳපොළේ හැමතැන ම ඇවිද්දා. මෙහෙම ඇවිදගෙන යද්දි ඔහුට ඇහුණා කඩ සාප්පුවක් ඇතුළේ ඉඳන් කවුද කතා කරනවා.

"ඔබ මේ පොඩි එකාට රස්සාවක් ද හොයන්නේ?" හම්බෝ සාප්පුවට ඔළුව දාලා බැලුවා. ඒ තමයි සාප්පුවේ හිටපු වෙළෙන්දා.

"ඔව් මහත්මයා" හම්බෝ බොහෝ ම ගරුසරුව පිළිතුරු දුන්නා.

වෙළෙන්දා ගිකෝර් දිහා හොඳට බැලුවා. ඔළුවේ ඉඳන් කකුල් දෙකට වෙනකන් ම බැලුවා.

"එහෙනම් මේකව මට දීපන්" ගිකෝර් දිහා බලාගෙන ම වෙළෙන්දා කිවුවා.

වෙළඳාම ඉක්මනට ම වෙච්ච එක ගැන හම්බෝටත් ගොඩක් සතුටු හිතුණා.

ඉතින් හම්බොත් ගිකෝර්ව "බෂාස් අර්තෙම්" කියන මේ වෙළෙන්දගේ ගෙදර වැඩකාර කමට දෙන්න එකඟ වුණා. හැබැයි අර්තෙම් ගිකෝර්ව රස්සාවට ගත්තේ කොන්දේසි කිහිපයක් මත.

ගිකෝර් අර්තෙම්ගේ නිවස පිරිසිදුව තියාගන්න ඕනේ, වළං පිඟන් හෝදන්න ඕනේ, සපත්තු ඔප දාන්න ඕනේ, අර්තෙම්ගේ දවල් කෑම එක එයාගේ කඩේට ම ගෙනත් දෙන්න ඕනේ. ඒ වගේ ම ගෙදර තියෙන අනිත් පොඩි පොඩි වැඩ සේරමත් කරන්න ඕනේ.

ගිකෝර්ට අර්තෙම් කියපු ඒ දේවල් ගැන ඒ තරම් වැටහීමක් තිබුණෙ නැති නිසා එයා මුකුත් ම කිවුවේ නැහැ. එහෙත් එයාගේ තාත්තා හම්බෝ නම් ගිකෝර්ගේ ඔළුව අතගාලා කිවුවා,

"මගේ පුතා ඒ හැම දේම හොඳට ම කරයි" කියලා.

ඒ වගේ ම අර්තෙම් පොරොන්දු වුණා අවුරුද්දක් ගෙදර වැඩකාරයෙක් විදියට වැඩකළාට පස්සේ, ගිකෝර්ට කඩේ වෙළඳාම ගැන උගන්නන්න.